# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2094/48 - 2018 ඔක්තෝබර් මස 27 වැනි සෙනසුරාදා - 2018.10.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය.*: 4/1/5/21.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ*
*අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2015/WS/29.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩමේ පරවශතා අයිතිය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශතාවයේ විස්තරය:*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 834 කුරුණෑගල නගරය ඊසාන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කුරුණෑගල නගරයෙහි (කොට්ඨාස අංක 5 - කුරුණෑගල මහ නගර සීමාව තුළ) පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2018.09.25 දිනැති, අංක කු 2383 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන, පැරමවුන්ට් වත්ත නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0134 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අංක 01**

ඉඩමේ නම: පැරමවුන්ට් වත්ත; ඉඩමේ මායිම්: උතුරට: එන්. එම්. ගමගේ හිමිකම් කියන පැරමවුන්ට් වත්ත, මාර්ගය සහ මූලික පිඹුරු අංක කු 1020 හා 3 වැනි බිම් කැබැල්ල, නැගෙනහිරට: මාර්ගය සහ මෙම පිඹුරේ 2 වැනි බිම් කැබැල්ල, දකුණට: මෙම පිඹුරේ 2 වැනි බිම් කැබැල්ල සහ සූරතිස්ස මාවත, බටහිරට: සූරතිස්ස මාවත සහ එන්. එම්. ගමගේ හිමිකම් කියන පැරමවුන්ට් වත්ත; හිමිකම් කියන්නන්ගේ නම හා ලිපිනයන්: එන්. එම්. ගමගේ මහත්මිය, පැරමවුන්ට් හෝටලය, සූරතිස්ස මාවත, කුරුණෑගල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0134.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ


1A - G 28813 - 22 (2018/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ලියකියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 2018 නොවැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 නොවැම්බර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2018 ඔක්තෝබර් මස 25 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

11-509

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.